වාර්ෂික වාර්තාව සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021



මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය



දැක්ම

ගෝලීය සන්දර්භය තුළ අභිවර්ධනීය සමාජයක සංවර්ධනයෙහි ලා මානව කුසලතා සංවර්ධනයට ඉගෙනුම්, ඉගැන්වීම් සහ පර්යේෂණ දායකත්වයේ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත් වීම.



මෙහෙවර

මානව සම්පත සංවර්ධනයට, අති නවීන තාක්ෂණයන් සහ ක්‍රමවේද උපයෝග කොට ගනිමින් දක්ෂ මෙන්ම මනාව කැපවූ කාර්ය මණ්ඩලයක් හරහා නායකත්වයේ තරගකාරී සංවර්ධනය, ව්‍යවසායකත්වය, සහ විවේචනාත්මක චින්තන හැකියාවන් සමග උසස් සමාජ සදාචාර ප්‍රමිතීන් ඉලක්කකොට අනේකවිධ කළමනාකරණ, කළමනාකරණ-නොවන රැකියා නියුක්තිකයන් සහ ව්‍යවසායකයින් උදෙසා ජාතික වශයෙන් තරගකාරී සහ ජාත්‍යන්තරව පිළිගත් ඉගෙනුම්, පර්යේෂණ සහ සංවර්ධන අවස්ථා සම්පාදනය කිරීම.

වටිනාකම්



වටිනාකම 01 - අධ්‍යාපනයේ නිදහස
විධිමත් උසස් අධ්‍යාපන අධ්‍යයන අවස්ථා අහිමිව සේවයේ නියුක්තව සිටින කළමනාකාරී නොවන සේවා නියුක්තිකයින් උදෙසා නිදහස් අධ්‍යාපනය අඛණ්ඩව සම්පාදනය කරන අතරම, උසස් අධ්‍යාපනික අවස්ථා පූරණය කර ගැනීමට නොහැකිවූ කළමනාකාරී සේවා නියුක්තිකයන්, සහ වෘත්තිකයන් සංවර්ධනය කිරීම අපි අගය කරමු.

වටිනාකම 02 - අභිවර්ධනීය චින්තනය
එකිනෙකාගේ කාර්යභාරය උපරිම කැපවීමකින් සිදු කරමින් අපගේ සාමූහික ප්‍රයත්නයේ ප්‍රතිඵල සාධාරණාත්මකව බෙදා ගනිමින් සහ අප ළඟා කරගත් දේ මානව සම්පත් අභිවර්ධන ආයතනය තුළ හා ඉන් පිටත අනාගත පරපුරට තිරසාරව පවත්වා ගනිමින් සහ දියුණු කරමින් සමාජයේ අභිවර්ධනය සඳහා සාමූහිකව කටයුතු කිරීම අපි අගය කරමු.

වටිනාකම 03 - විවිධත්වය හා අන්තර්ගතය
අප විවිධත්වය අගය කරනවා පමණක් නොව, අපගේ ආයතනය සහ සමාජය විසින් විවිධත්වයන් ප්‍රතිලාභ ලබා ගැනීම සහතික කිරීම උදෙසා අපගේ සාරධර්ම, විශ්වාස, පසුතල, කුසලතා සහ කාර්ය දිශානතියෙහි වෙනස්කම් පිළිගෙන ප්‍රවර්ධනය කරන අන්තර්ග්‍රහණීය කාර්ය සංස්කෘතියක් අපි අගය කරමු.

වටිනාකම 04 - ප්‍රජාවගේ ජීව ගුණය
එකම අරමුණක් පෙරදැරි කොට ඒකීය අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙන් ඒකීය ප්‍රජාවක් ලෙස 'මම'නොව 'අප' යන ගුණය ගොඩ නැගීමට හේතු පාදක වන අභිලාෂයන්ගෙන් යුක්තවන්නා වූ මානව ප්‍රජාවක් බවට පත්වීමට කටයුතු කිරීම අපි අගය කරමු.

වටිනාකම 05 - අප සිදු කරන දෑ පවරා දීම
මානව සම්පත් අභිවර්ධන ආයතනික ප්‍රජාවගේ සහ ඉන් පරිබාහිර ප්‍රජාවගේද සදාචාරාත්මක නිවැරැදි පැවැත්ම අප දිරිගන්වනු ලබන අතර දැනුම සහ තොරතුරු එක් රැස් කිරීමේ අසීමාන්තික අයිතිය උසස් අධ්‍යාපන ඉගෙනුම් සම්පාදන ආයතනයක් පවත්වා ගත යුතු රහස්‍යභාවය තහවුරු කරමින් පවත්වාගෙන යාම අපි අගය කරමු.

අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය



කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2021 වාර්ෂික වාර්ථාව සහ වාර්ෂික මුල්‍ය ප්‍රකාශය වෙත සමාලෝචනයක් ලිවීමට ලැබීම මට ඉමහත් සතුටකි.

කොවිඩ්-19 වසංගතය ලොව පුරා මිනිසුන්ගේ දෛනික චර්යාවන් සහ අභිලාෂයන් සැලකිය යුතු ලෙස වෙනස් කර ඇත. වසංගතය පාසල් පද්ධතිය, ඉගැන්වීමේ ක්‍රම, රුකියා අවස්ථා, ශ්‍රම ඉල්ලුම, ආයතනික මෙහෙයුම් සහ පාලනය ඇතුළු මානව සම්පත් සංවර්ධන සහ කළමනාකරණයේ බොහෝ ක්ෂේත්‍රයන්වලට සෘණාත්මක ලෙස බලපෑම් කර ඇත. එහෙත්, 2021 වසර තුළ ආයතනික ක්‍රියාකාරකම් කෙරෙහි කොවිඩ්-19 වසංගතයේ බලපෑම අඩු කිරීමට මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් සැලකිය යුතු මැදිහත්වීම් සිදු කර ඇත.

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අරමුණ වන්නේ ‘ශ්‍රී ලංකාවේ සේවක උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම’ ය. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මට්ටමේ සේවකයින් සඳහා උසස් අධ්‍යාපනය ලබා දෙන එකම ආයතනය ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය හඳුන්වා දිය හැක. මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් 2021 වර්ෂය සඳහා සහතිකපත්, ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා, උපාධි සහ ශාස්ත්‍රපති උපාධිධාරීන් රැසක් බිහි කර ඇති බව ප්‍රකාශ කිරීම මා හට ආඩම්බරයකි. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සහතික පත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා වැඩසටහන්, උපාධි හා ශාස්ත්‍රපති උපාධි ඇතුළු සියලුම අධ්‍යයන වැඩසටහන් හරහා අප සිසුන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම සහතික කරයි. ඉගැන්වීම්-ඉගෙනීමේ ක්‍රියාවලිය සහ පර්යේෂණ උසස් අධ්‍යාපනයෙන් වෙන් කළ නොහැකි සාධක බව අප දනිමු. එබැවින් මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය මෙම මූලිකාංග තුන මත පදනම්ව අධ්‍යයන නිදහස පවත්වා ගනිමින් ඔවුන්ගේ අධ්‍යයන කාර්යය භාරය ඉටු කරයි.

ඉගෙනීමේ ආශාවක් සහ කැපවීමක් ඇති පුද්ගලයින්හට ඔවුන් සිහින මැවූ වඩා යහපත් ප්‍රතිඵල අප සමග ඉගෙනීම තුළින් ලබා ගත හැකිය. අපගේ දැක්ම වන්නේ ගෝලීය සන්දර්භය තුළ ප්‍රගතිශීලී සමාජ සංවර්ධනය සඳහා මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා ඉගැන්වීමේ, ඉගෙනීමේ සහ පර්යේෂණවල විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීමය. නායකත්වය, ව්‍යවසායකත්වය සහ විවේචනාත්මක චින්තනය යන ක්ෂේත්‍රයන්හි නිපුණතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් විවිධ කළමනාකරණ, කළමනාකරණය නොවන සේවකයින් සහ ව්‍යවසායකයින් සඳහා ඉගෙනීමේ, පර්යේෂණ සහ සංවර්ධන ක්‍රම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය ජාතික වශයෙන් තරගකාරී සහ ජාත්‍යන්තරව පිළිගත් අවස්ථාවන් රැසක් සපයයි. මානව සම්පත් අභිවර්ධන ආයතනයෙහි කාර්යය මණ්ඩලයේ සහය, අති නවීන තාක්ෂණය සහ මානව සම්පත් සංවර්ධන ක්‍රම උපයෝගි කර ගනිමින් සිසුන්ට සුවිශේෂී ඉගෙනුම් අවස්ථා සහ අත්දැකීම් ප්‍රගුණ කළ හැකි අතර එය ඉතා ඵලදායී සේවකයින් වීම සඳහා ඔවුන්ගේ හැකියාව වර්ධනය කර ගැනීමට රුකුලකි. ස්වයං දැනුම වර්ධනය කිරීම කේන්ද්‍රීය ලක්ෂණයක් වන්නේ එය ඉතා ඵලදායී හා සාර්ථක රුකියාවක් සඳහා පදනම වන බැවිනි. අප ආයතනය බලාපොරොත්තු වන ප්‍රතිඵලය වනුයේ ක්‍රියාකාරී චිත්තවේගීය සහ තත්ත්ව කුසලතා මත පදනම්ව ශිෂ්‍යයින් ඔවුන් තෝරාගත් වෘත්තිය සහ වෘත්තිය ප්‍රජාව තුළ සාර්ථක සේවකයින් කර වීමය.

ඔබේ ජීවිතයේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට සහ ප්‍රගතිශීලී සමාජයක් සඳහා දායක වීමට හැකි වන පරිදි ඔබේ කුසලතා සහ හැකියා වර්ධනය උදෙසා විශිෂ්ට සහ ආකර්ෂණීය අවස්ථාවන් ගවේෂණය කිරීම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය ඉඩ ප්‍රස්ථාව සලසා ඇත.

මහාචාර්ය සාගර චන්ද්‍රසේකර
අධ්‍යක්ෂ
මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

පටුන

වාර්ෂික වාර්තාව - 2021

1. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය....01
   1.1 මානව සම්පත් අභිවර්ධන ආයතනය ගැන කෙටියෙන්....01
   1.2 2021 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා....02
   1.3 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කළමනාකාරිත්වය....03
   1.4 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහය....04
   1.5 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කමිටු....04
   1.6 කොවිඩ්-19 වසංගතය හමුවේ මානව සම්පත් අභිවර්ධන ආයතනය....06

2. 2021 වර්ෂය තුළ සංවර්ධනය සහ ලබා ගත් ජයග්‍රහණ....07
   2.1 සංවර්ධනයන්....07
   2.2 ජයග්‍රහණයන්....07
      2.2.1 අධ්‍යාපනික ජයග්‍රහණයන්....07
      2.2.2 වසර තුළ පවත්වන ලද වැඩමුළු සහ ජාලගත සම්මන්ත්‍රණ....08

3. වාර්ෂික සමාලෝචනය 2021....09
   3.1 අධ්‍යයන වැඩසටහන්....09
      3.1.1 පශ්චාද් උපාධි වැඩසටහන්....09
      3.1.2 ප්‍රථම උපාධි වැඩසටහන....10
      3.1.3. විධායක/උසස් ඩිප්ලෝමා වැඩසටහන්....11
      3.1.4 ඩිප්ලෝමා පාඨමාලා....12
      3.1.5 සහතිකපත් පාඨමාලා....13
   3.2 2021 වර්ෂයේ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු....14
   3.3 පර්යේෂණල නවෝත්පාදන සහ ප්‍රකාශන පිළීබඳ විස්තර....16
   3.4 අධ්‍යයනල පරිපාලනල අධ්‍යයන සහය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු - 2021....20
   3.5 පුස්තකාලය....21

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2021

ආයතනික තොරතුරු....23
පිළියෙල කිරීමේ පදනම....23
සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හි සාරාංශය....24
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය....27
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය....28
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ....29
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම/ශුද්ධ වත්කම්වල වෙනසක පිළිබඳ ප්‍රකාශය....30
මුදල් ප්‍රකාශ සඳහා සටහන....31
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ III වන කොටසේ අංක 17 (ඇ) යටතේ දක්වා ඇති තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව - 2021....50
විගණකාධිපතිගේ වාර්තාව....55
2020 වර්ෂයට අදාළ විගණන වාර්තාව පිළිබඳ ආයතනයේ අදහස්....62

1. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය දශක හතරකට වඩා උරුමකම් කියන අතර එහි පූර්වක ආයතනය වූ සේවක අධ්‍යාපන ආයතනය 1979 අංක 11 දරන නියමාවලිය යටතේ 1975 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී. 2006 වර්ෂයේ දී සේවක අධ්‍යාපන ආයතනය, මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස නම් කරන ලද අතර එය 2006 අංක 01 දරන නියමාවලිය මගින් සංශෝධනය කරනු ලැබිණ. 2017 අගෝස්තු 22 දිනැති අංක 2033/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිත නියමාවලිය මගින් මානව සම්පත් අභිවර්ධන ආයතනයට උපාධි, ඩිප්ලෝමා, සහතිකපත් සහ අනෙකුත් අධ්‍යයන විශිෂ්ඨතා සහතික පිරිනැමීමට අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදී. 2021 මාර්තු 16 දිනැති අංක 2219/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් නැවත නියමාවලිය සංශෝධනය කරනු ලැබූ අතර එම නියමාවලිය 2021 අංක 01 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මානව සම්පත් අභිවර්ධන ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයකි.

දශක හතරකට අධික ඉතිහාසය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය එහි පරිස්ථිතිය තුළ වෙනස්කම් සහ නව සංවර්ධනයන් රැසක් අත්දැක ඇති අතර පෞද්ගලික අංශයේ වර්ධනය දැනුම් ආර්ථිකයේ නිර්ගමනය හා ශ්‍රම බලකායේ ගෝලීයකරණය මේ අතරින් සැලකිය යුතු කීපයකි. මෙම සංවර්ධනයන් වැළඳ ගැනීමට දරන ප්‍රයත්නයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය අඛණ්ඩව පරිණාමය වී ඇති අතර එහිදී එහි මුල් අභිමතාර්ථයක් වන සේවා කණ්ඩායම් සඳහා අධ්‍යාපනය ලබා දීමේ නව අර්ථයක් ගෙන ඇත. වර්තමානයේදී "සේවා කණ්ඩායම්" ලෙස කළමනාකරණ/ වෘත්තීමය සේවා කණ්ඩායම් අර්ථ ගන්වන අතර මානව සම්පත් අභිවර්ධන ආයතනය මෙම කළමනාකරණ/ වෘත්තීමය සේවා කණ්ඩායම් හි මානව කුසලතා සංවර්ධනය සඳහා කැප වී සිටියි.

කොළඹ විශ්වවිද්‍යාලයීය ආයතනයක් වීම තුළ ආයතනයේ අධ්‍යයන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ දැඩි අධීක්ෂණයට ලක් වේ. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගත යුතු අධ්‍යයන කටයුතුවල උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ යහපත් සම්ප්‍රදායන් ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය බැඳී සිටී.

මානව සම්පත් අභිවර්ධන ආයතනය මූලිකවම ආරම්භ කරන ලද්දේ සියලුම කාණ්ඩවල සේවකයන්ට ඔවුන්ගේ කුසලතා නායකත්ව ගුණාංග සහ ශ්‍රමිකයන් ලෙස ඔවුන්ගේ වගකීම් පිළිබඳ පිළිගන්නා ගුණාත්මකභාවයෙන් යුත් පෘථුල උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීම සඳහා පහසුකම් සැලසීමටය. එමගින් ඔවුන්ට තම සේවා ස්ථානයන්හි ඵලදායී දායකත්වයක් ලබා දීමට හැකිවන අතර 1983 වන තෙක්ම එම උපාධිය ප්‍රදානය කරන ලද්දේ ශ්‍රාස්ත්‍රවේදී උපාධියක් වශයෙනි. කෙසේ වුවද 1986 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය පිරිනැමීම ආරම්භ කරන ලද අතර 2007 වර්ෂයේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය සිය අධ්‍යයන ක්‍රියාකාරකම් ව්‍යාප්ත කරමින් ශාස්ත්‍රපති උපාධි පිරිනැමීම ද ආරම්භ කරන ලදී.

1.1 මානව සම්පත් අභිවර්ධන ආයතනය ගැන කෙටියෙන්

2021 වර්ෂයේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය ශාස්ත්‍රපති උපාධි විද්‍යාර්ථීන් 438ක් සහ ප්‍රථම උපාධිය හදාරන විද්‍යාර්ථීන් 549ක් ඇතුළුව සිසු සිසුවියන් 2,100 කට ආසන්න සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබා දී ඇත. මානව සම්පත් අභිවර්ධන ආයතනය, එය පිහිටුවා ඇති අරමුණ සැලකිල්ලට ගෙන ගතික අධ්‍යයන වැඩසටහන් පිරිනමනු ලබයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබා ගන්නා ලද නව උපාධි වැඩසටහන වන ශ්‍රම කළමනාකරණවේදී උපාධිය (සාමාන්‍ය) තුන් අවුරුදු පාඨමාලාවට ප්‍රථම විද්‍යාර්ථීන් කණ්ඩායම ඇතුළත් කර ගැනීමට වර්ෂය තුළ දී කටයුතු කරන ලදී.

නව උපාධි පාඨමාලාව උසස් ගුණාත්මකභාවයෙන් යුත් රැකියා නියුක්ත උපාධි අපේක්ෂකයින්ට සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙන්ම පාඨමාලාව හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත. අපගේ ප්‍රථම උපාධි වැඩසටහන ප්‍රධාන වශයෙන්ම වැඩකරන ප්‍රජාවට ඔවුන්ගේ වැඩ පරිසරයට ගැළපෙන පරිදි සිය කුසලතා, හැකියාවන් සහ නායකත්ව කුසලතා දියුණු කර ගැනීම ඉලක්ක කොට ඇත.

මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පිරිනමනු ප්‍රධාන කාණ්ඩ 04ක් යටතේ අධ්‍යයන

වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ. ඒවා නම්, පශ්චාත් උපාධි පාඨමාලා 04ක් උපාධි පාඨමාලා 02ක්, උසස්/විධායක ඩිප්ලෝමා පාඨමාලා 02ක්, ඩිප්ලෝමා පාඨමාලා 05ක් සහ සහතිකපත්‍ර පාඨමාලා 10 ක් වශයෙනි. මෙම පාඨමාලා 2018-2022 ආයතනික සැලැස්මට අනුකූලව පෙළගස්වා ඇත.

සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචිය - 2021



මූලාශ්‍රය - රැස් කළ දත්ත 2021 මා.ස.අ.ආ.

2021 වර්ෂය තුළ ඉහත දක්වා ඇති පරිදි සමස්ත සිසු සිසුවියන් 2,082 ක් විවිධ අධ්‍යයන පාඨමාලා හදාරන ලදී.

1.2 2021 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා

පශ්චාත් උපාධි පාඨමාලා

- සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව
- ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව
- මානව සම්පත් කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව
- ආපදා විශ්ලේෂණ, කළමනාකරණ සහ පාලනය විද්‍යාපති පාඨමාලාව

ප්‍රථම උපාධි පාඨමාලා

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව
- ශ්‍රම කළමනාකරණවේදී උපාධි පාඨමාලාව

විධායක/උසස් ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා

- සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව
- උපදේශනය සහ මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- සේවා කළමණාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
- මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණය ඩිප්ලෝමා පාඨමාලාව
- උපදේශනය සහ මනෝවිද්‍යාව ඩිප්ලෝමා පාඨමාලාව
- අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව
- ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව

සහතිකපත් පාඨමාලා

- ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව
- පාසල් හැරයන්නන් සඳහා වූ කෙටිකාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව
- ඉංග්‍රීසි භාෂා පදනම් සහතිකපත් පාඨමාලාව
- දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව- මූලික මට්ටම
- දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව- අන්තර්මධ්‍යම මට්ටම
- පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව
- ජපන් භාෂා සහතිකපත් පාඨමාලාව- මූලික මට්ටම

- කොරියානු භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික මට්ටම

අභියෝගාත්මක ගෝලීය තත්වයන් හමුවේ මුහුණ දීමට මෙන්ම අපගේ ජාතික සංවර්ධනයේ මානව පදනම ශක්තිමත් පරිණත, "බුද්ධිමත් දැනුම භාවිත කරන්නන්" ලෙස මානව සම්පත අභිවර්ධනය කිරීමට සම්පූර්ණයෙන් කැප වූ විශිෂ්ට ආයතනයක් බවට පත් වීමට මානව සම්පත් අභිවර්ධන ආයතනය බලාපොරොත්තු වේ. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලයෙන් උරුම වී ඇති ධනාත්මක ශාස්ත්‍රීය සම්ප්‍රදායන් සහ උසස් අධ්‍යයන ප්‍රමිතීන් තහවුරු කර ගනිමින් විශාල පරිවර්තනයකට බඳුන් වෙමින් පවතී. යහ පාලනයේ ප්‍රමිතීන් සපුරාලීම, ආයතන අධ්‍යයන වැඩසටහන් සඳහා දේශීය හා ගෝලීය ප්‍රතිතනයන් ලබා ගැනීම සහ එමගින් සමාජීය වගකීමකින් යුත් ඉහළම ඉල්ලුමක් ඇති සේවක සන්නාමයක් සහිත රාජ්‍ය ආයතනයක් බවට පත් වීම මෙම පරිවර්තනයේ අරමුණ වේ.

1.3 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කළමනාකාරිත්වය

පූර්ණ කාලීන නිලධාරියෙකු ලෙස සේවය කරන ආයතනයේ පරිපාලනමය සහ අධ්‍යයන ප්‍රධානියා වන ආයතනයේ අධ්‍යක්ෂවරයා, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශය මත කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ එකඟතාව සහිතව උප කුලපති විසින් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂවරයා ශාස්ත්‍රීය කමිටුවේ සභාපතිවරයා වන අතර අධ්‍යයන කමිටු සඳහා නිලබලයෙන් පත් වූ සාමාජිකයෙකුද වේ. ඔහු ආයතනයේ ප්‍රධාන ගිණුම් නිලධාරියා ද වන අතර ආයතනය තුළ විනය පවත්වාගෙන යාමේ වගකීම දරන්නා ද වේ.

මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතාගේ 2020 අගෝස්තු මස 28 දින සිදු වූ හදිසි අභාවය හේතුවෙන් කේ.පී. මාතොටආරාච්චි මහත්මිය (කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) නව අධ්‍යක්ෂවරයෙකු පත්කරන තුරු මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වැඩ බලන අධ්‍යක්ෂවරිය ලෙස 2021 ජනවාරි මස 31 වන දින දක්වා සේවය කරන ලද අතර 2021 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර තුනක කාලයක් සඳහා ස්ථිර අධ්‍යක්ෂවරයා වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ව්‍යාපාර ආර්ථික අංශයට අනුයුක්තව සිටි ජ්‍යෙෂ්ඨ (විනෙතෘ) මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න මහතා පත් කරනු ලැබිණ.

2021 මාර්තු මස සිට ක්‍රියාත්මක වන 2021 අංක 01 දරන නියමාවලිය මගින් ආයතන පරිපාලන ව්‍යුහයේ වෙනස් කිරීමක් සිදු වූ අතර, නව නියමාවලියට අනුව ආයතනයේ ප්‍රධාන පරිපාලන ව්‍යුහය කළමනාකරණ මණ්ඩලයකින් සහ අධ්‍යයන සමායෝජක කමිටුව, අධ්‍යයන මණ්ඩල සහ කමිටු මගින් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂවරයා, ආයතනයේ පරිපාලනමය සහ අධ්‍යයන ප්‍රධානියා වශයෙන් සේවයේ නියුක්ත වන පූර්ණ කාලීන නිලධාරියෙකු වේ. නව නියමාවලියට අනුව ආයතන අධ්‍යක්ෂකවරයා පත් කිරීමේ බලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැවරී තිබේ. එහිදී අධ්‍යක්ෂකවරයා, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ එකඟතාව සහිතව උප කුලපතිවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත නිර්දේශ කරනු ලබන අතර, අධ්‍යක්ෂකවරයා තෝරා පත් කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි. අධ්‍යක්ෂකවරයා කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වන අතර අධ්‍යයන කමිටු සඳහා නිලබලයෙන් පත් වූ සාමාජිකයෙකුද වේ. ඔහු ආයතනයේ ප්‍රධාන ගිණුම් නිලධාරියා ද වන අතර ආයතනය තුළ විනය පවත්වාගෙන යාමේ වගකීම දරන්නා ද වේ.

ආයතනයේ සංවිධාන ව්‍යුහය පහත දක්වා ඇත.

1.4 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහය - 2021 අප්‍රේල් මස දක්වා



මෙම නව ව්‍යුහය ආයතනයේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවන පරිදි සකස් කොට ඇත.

1.4.1 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහය - 2021 මැයි මස සිට



1.5 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කමිටු

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහයට අනුව එහි අධ්‍යයන මණ්ඩල හතර (04) ශාස්ත්‍රීය කමිටුවේ අනුමැතිය සහිතව පිහිටුවා ඇත. නව නියමාවලි සංශෝධනයෙන් පසු 2021 මැයි මස සිට කළමනාකරණ මණ්ඩලය ලෙස ප්‍රධාන පරිපාලන ව්‍යුහය වෙනස් කෙරුණු අතර අධ්‍යයන විෂය ක්ෂේත්‍ර අනුව පිහිටවූ අධ්‍යයන මණ්ඩල අධ්‍යයන සමායෝජක කමිටුවට යටත් වේ. තවද අධ්‍යක්ෂවරයාගේ මාර්ගෝපදේශනය යටතේ පිහිටුවා ඇති කමිටු හතකින්

(07) ද පරිපාලන ව්‍යුහය සමන්විත වේ.

1.5.1 ශාස්ත්‍රීය කමිටු සාමාජිකයන් (2021 අප්‍රේල් දක්වා) - රැස්වීම් වාර 03ක් පවත්වා ඇත

නම	පත් කරන ලද අධිකාරිය
කේ.පී. මාතොටආරච්චිච් මිය - වැඩබලන අධ්‍යක්ෂවරිය (2021 ජනවාරි මස 31 දක්වා)	සභාපතිනිය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න (2021 පෙබරවාරි මස සිට)	සභාපති
මහාචාර්ය උපුල් සොන්නාදර මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික
ආචාර්ය එල්.එම්. කපිල බණ්ඩාර	නිල බලයෙන් පත් වූ සාමාජික
මහාචාර්ය ලසන්ත මානවඩු මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික
මහාචාර්ය යූ.ජී.ඒ. පුස්වේවල මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
මහාචාර්ය කේ.ඒ.පී. සිද්ධිසේන මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ආචාර්ය එම්.ඒ.සී. ගයත්‍රි විජේසුන්දර	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ආචාර්ය එස්.ඒ.එම්.කේ. සමරකෝන් මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ප්‍රේමචන්ද්‍ර ඇපා මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
එච්.එම්.ඩබ්. හේරත් මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
මහාචාර්ය අජිත් දිසානායක	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ඩී.එස්. අමරසිංහ මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
මහාචාර්ය ඒ.ඒ. අසීස් මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත
ආචාර්ය එම්.ජී.ජී. හේමකුමාර මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත
ආචාර්ය ඩබ්.එස්. චන්ද්‍රසේකර මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත
මහාචාර්ය ඩි.ඒ.සී. සිල්වා	අධ්‍යයන මණ්ඩල නියෝජිත
ජෙ.ඒ.ටී.ඩී. සරත් කුමාර මහත්මිය	අධ්‍යයන මණ්ඩල නියෝජිත
එච්.ඩී. ධර්මසේකර මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත

1.5.2 කළමනාකරණ මණ්ඩලය සාමාජිකයන් (2021 මැයි මස සිට) - රැස්වීම් වාර 07ක් පවත්වා ඇත.

නම	පත් කරන ලද අධිකාරිය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න මහතා	සභාපති
මහාචාර්ය උපුල් සොන්නාදර මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික
මහාචාර්ය ලසන්ත මානවඩු මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික
ආචාර්ය කපිල බණ්ඩාර මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික
ආචාර්ය ඩී.එම්.ඒ. දිසානායක මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ආචාර්ය එම්.ඒ.සී. ගයත්‍රි විජේසුන්දර	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
එච්.එම්.ඩබ්. හේරත් මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ප්‍රේමචන්ද්‍ර ඇපා මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ධම්මික වික්‍රමසිංහ මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ආර්.ඒ.යූ රණවීර මහතා	වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික
ජේ.ඒ.ටී.ඩී. සරත් කුමාර මහත්මිය (2021 අගෝස්තු මස සිට)	මහා භාණ්ඩාගාර නියෝජිත

මහාචාර්ය එම්.පී.පී. ධර්මදාස	අධ්‍යයන මණ්ඩල නියෝජිත
ආචාර්ය ඩබ්.එස්. චන්ද්‍රසේකර මහතා	අධ්‍යයන මණ්ඩල නියෝජිත

2021 අංක 01 නව නියමාවලියට අනුව ආයතනයේ පැවති අධ්‍යයන මණ්ඩල හතර (04) සහ කමිටු හත (07) ට අමතරව අධ්‍යයන සම්බන්ධීකරණ කමිටුව නමින් නව කමිටුවක් පත් කරන ලද අතර අධ්‍යයන මණ්ඩල හතරෙහි (04)හි නිර්දේශයන් කළමනාකරණ මණ්ඩලය වෙත යොමු කිරීම මෙම කමිටුව හරහා සිදු කෙරේ.

1.5.3 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන මණ්ඩල මගින් පවත්වන ලද රැස්වීම්

අධ්‍යයන මණ්ඩලය	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ මණ්ඩලය	09
ප්‍රථම උපාධි පාඨමාලා අධ්‍යයන මණ්ඩලය	10
භාෂා ඉගෙනුම් වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය	07
ව්‍යාප්ති වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය	11

1.5.4 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කමිටු මගින් පවත්වන ලද රැස්වීම්

ශාස්ත්‍රීය කමිටුව/කළමනාකරණ මණ්ඩලයට සෘජුව වග කියනු ලබන කමිටු අට (08) කින් ආයතනික ව්‍යුහය සමන්විත වේ. එම කමිටුවල විස්තර පහත දක්වා ඇත.

කමිටුව	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
අධ්‍යයන සම්බන්ධීකරණ කමිටුව	07
විගණන කමිටුව (ස්වාධීන කමිටුවකි)	04
මූල්‍ය කමිටුව	06
පුස්තකාල කමිටුව	03
ප්‍රසම්පාදන කමිටුව	15
ප්‍රහුණු හා සංවර්ධන කමිටුව	00*
පර්යේෂණ ප්‍රතිපාදන කමිටුව	01
අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කමිටුව	01

*රට තුළ උද්ගත වූ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රහුණු හා සංවර්ධන වැඩසටහන් කිසිවක් සිදු කර නොමැත.

1.6 කොවිඩ්-19 වසංගතය හමුවේ මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොවිඩ්-19 වසංගතය 2020 මාර්තු මස මැද භාගයේ සිට ආයතනයේ අධ්‍යයන කටයුතුවලට සැලකිය යුතු අන්දමින් බලපෑවේය. මාර්ගගත වේදිකාව භාවිත කරමින් අධ්‍යයන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමට මානව සම්පත් අභිවර්ධන ආයතනය හැකි සෑම උත්සාහයක්ම ගත්තේය.අභියෝග මධ්‍යයේ වුවද, මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට නොමඳව සම්පත් සහ පහසුකම් සැපයීම සිදු කරන ලදී. එමෙන්ම, මානව සම්පත් අභිවර්ධන ආයතනය සිසුන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීමට සහ අවශ්‍යතා සපුරා ගන්නා තෙක් සහයෝගය ලබා දීමට ද මානව සම්පත් අභිවර්ධන ආයතනය සමත් විය.

තවද, වසංගතය පැතිරයාම වැඩි වීමත් සමග මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩලය සහ එහි සිසුන් ආරක්ෂා කර ගැනීම සඳහා ආයතන කළමනාකාරිත්වය බොහෝ උත්සාහයන් ගත්තේය. පෙර නොවූ විරූ අභියෝගයන් මධ්‍යයේ වුවද, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සංවිධානාත්මක මෙහෙවර සාක්ෂාත් කර ගැනීම කෙරෙහි මානව සම්පත් අභිවර්ධන ආයතනය සිය අවධානය යොමු කළේය.

නිවසේ සිට වැඩ කිරීම “work from Home” (WFH) යන සංකල්පය හඳුන්වා දෙන ලදී. කාර්ය මණ්ඩලය අතථ්‍ය (Virtual) හමුවීම් හරහා සම්බන්ධ වූ අතර එමගින් එහි සංවිධානාත්මක අරමුණු සාක්ෂාත් කර ගැනීමට මානව සම්පත් අභිවර්ධන ආයතනයට හැකි විය.

2. 2021 වර්ෂය තුළ සංවර්ධනය සහ ලබා ගත් ජයග්‍රහණ

2.1 සංවර්ධනයන්

- 2021 මාර්තු 16 දිනැති අංක 2219/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් නියමාවලිය සංශෝධනය වීම. 2021 මාර්තු මස සිට ක්‍රියාත්මක වන 2021 අංක 01 දරන නියමාවලිය මගින් ආයතන පරිපාලන ව්‍යුහයේ වෙනස් කිරීමක් සිදු වූ අතර, නව නියමාවලියට අනුව ආයතනයේ ප්‍රධාන පරිපාලන ව්‍යුහය කළමනාකරණ මණ්ඩලයකින් සහ අධ්‍යයන සම්බන්ධීකරණ කමිටුව, අධ්‍යයන මණ්ඩල සහ කමිටු මගින් ක්‍රියාත්මක වේ.

- සේවක ප්‍රජාව සඳහා පුළුල් අවස්ථා සම්පාදනය කරමින් ශ්‍රම කළමනාකරණය විශේෂ කොට ගත් නව ප්‍රථම උපාධි වැඩසටහනක් හඳුන්වා දීමට කටයුතු කෙරුණු එහි ප්‍රථම විද්‍යාර්ථීන් කණ්ඩායම බඳවා ගැනීමට 2021 වසරේදී හැකියාව ලැබුණි.

- නව උපාධි පාඨමාලාව ශ්‍රම කළමනාකරණවේදී (සාමාන්‍ය) සහ ශ්‍රම කළමනාකරණවේදී (ගෞරව) උපාධි ලෙස ගෞරව උපාධි පාඨමාලාවක් දක්වා උසස් කිරීමට හැකි විය. ඒ අනුව, විද්‍යාර්ථීන් සඳහා පුළුල් අවස්ථා විවෘත කරමින් විෂයමාලා සංවර්ධනය කොට නව්‍ය මුහුණුවරකින් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

- ආයතනයට පිවිසෙන ප්‍රධාන දොරටුව බෞද්ධාලෝක මාවත දෙසට විවෘත වන පරිදි වෙනස් කෙරිණ.

- නව පිවිසුම් දොරටුව අභියස මානව සම්පත් අභිවර්ධන ආයතනයේ නව නාම පුවරුවක් සවි කිරීම.

- දේශන ශාලා 02, ආපනශාලාව සහා කථිකාචාර්යවරුන්ගේ කාමර ඉදිරිපිට ඇති CFL බල්බ වෙනුවට LED බල්බ ආදේශ කෙරිණ.

- CCTV යන්ත්‍ර යාවත්කාලීන කිරීම.

2.2 ජයග්‍රහණයන්

2.2.1 අධ්‍යාපනික ජයග්‍රහණයන්

- උසස් අධ්‍යාපනයට නව මංපෙත් විවර කරමින් පශ්චාද් උපාධි ඩිප්ලෝමා පැවැත්වීමට අවශ්‍ය නීති-රෙගුලාසිමාලාව සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට හැකි විය.

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන, සියලුම පශ්චාද් උපාධි වැඩසටහන්, විධායක/ උසස් ඩිප්ලෝමා හා ඩිප්ලෝමා වැඩසටහන් මෙන්ම සහතිකපත් පාඨමාලාවන් යන සෑම වැඩසටහනකම අන්තර්ක්‍රියාකාරී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමයක් සාර්ථකව උපයෝජනය කෙරේ.

- අධ්‍යයන කටයුතු සඳහා සහතිකපත් වැඩසටහන් හැර අනෙක් සියලුම අධ්‍යයන වැඩසටහන් ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) සාර්ථකව භාවිත කරයි.

- ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ද මිශ්‍ර ඉගෙනුම්-ඉගැන්වීම් (BTL) ක්‍රමවේදය සාර්ථකව සිදුවෙමින් පවතී.

- විධායක/ උසස් ඩිප්ලෝමා හා ඩිප්ලෝමා වැඩසටහන් සඳහා විෂයමාලා සමාලෝචනය කිරීමේ කටයුතු සාර්ථකව සිදුවෙමින් පවතී.

- භාෂා ඉගැන්වීම් ඒකකය මගින් ජපන් භාෂා සහතික පත්‍ර පාඨමාලාවක් මෙන්ම කොරියානු භාෂා සහතික පත්‍ර පාඨමාලාවක් හඳුන්වා දීමට කටයුතු කෙරිණ.

- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන වැඩසටහන්වල නව පියවරක් තබමින් ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාවක් හඳුන්වා දීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.

- අධ්‍යයන කාර්ය මණ්ඩල එක් සාමාජිකයෙක් විදේශගතව පශ්චාත් උපාධිය සඳහා අධ්‍යයනය කටයුතු කරමින් සිටී.

- ජෙනරාල් ශ්‍රීමත් ජොන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය 14 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ නීතිය පිළිබඳ පර්යේෂණ සැසියේදී හොඳම පර්යේෂණ පත්‍රය සඳහා වූ සම්මානය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කථිකාචාර්ය කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා විසින් ලබා ගන්නා ලදී.

- මෙක්සිකානු මූල්‍ය විධායක ආයතනය සහශ්‍ර මගින් පවත්වනු ලැබූ 37 වන මූල්‍ය පර්යේසණ සම්මාන උළෙලේ දී මෙක්සිකෝවේ ආණ්ඩුකාරවරයා විසින් පිරිනමන හොඳම පර්යේෂණ පත්‍රිකාවට අදාල ජාත්‍යන්තර මූල්‍ය පර්යේෂණ සම්මානය (IMEF & EY Award) ප්‍රථම ස්ථානය, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කථිකාචාර්ය ඩී.එච්.ඩී. නදිශා මහත්මිය විසින් දිනා ගන්නා ලදී.

- මෙක්සිකෝවේ Centro de Empresas Familiares, මොන්ටෙරෙඩ විශ්වවිද්‍යාලය, විසින් පිරිනමන ලද හොඳම පරඩයේෂණ පත්‍රිකාවට අදාල ජාත්‍යන්තර UDEM Adalberto Viesca Sada සම්මානය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කථිකාචාර්ය ඩී.එච්.ඩී. නදිශා මහත්මිය විසින් දිනා ගන්නා ලදී.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය විසින් පැවැත්වූ ව්‍යාපාර පරිපාලනාධිපති උපාධි පාඨමාලාවේ විශිෂ්ටතම කාර්යසාධනය සඳහා ජාතික සම්මානය සඳහා වූ මහාචාර්ය උදිත ලියනගේ අනුස්මරණ රන් පදක්කම මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කථිකාචාර්ය සී.එල්. ඒදිරිසිංහ මහත්මිය දිනා ගන්නා ලදි.

- ජෙනරාල් ශ්‍රීමත් ජොන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවයේදී නීතිපති උපාධි පාඨමාලාවේ හොඳම කාර්යසාධනය සඳහා වූ ජාතික සම්මානය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කථිකාචාර්ය කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා විසින් ලබා ගන්නා ලදි.

- පුස්තකාල සුචිය සංවර්ධනය කිරීම සහ ඩිජිටල් ගබඩාව (IHRA/LDR) සම්පූර්ණ කොට ඇත.

2.2.2 වසර තුළ පවත්වන ලද වැඩමුළු සහ ජාලගත සම්මන්ත්‍රණ

- මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2021 අගෝස්තු මස 05 සහ 06 යන දිනවල මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සාර්ථකව පැවැත්වීමට හැකිවිය. මෙවර එහි තේමාව වූයේ “මානව සම්පත් සංවර්ධනය සහ කළමනාකරණය කෙරෙහි කොවිඩ්-19 සෞඛ්‍ය අර්බුදයේ බලපෑම” යි. එහි ප්‍රධාන දේශනය ජපානයේ මෙයිජෝ විශ්වවිද්‍යාලයේ විදේශ අධ්‍යයන පීඨයේ මහාචාර්ය ආනන්ද කුමාර මහතා විසින් සිදු කරන ලදී. ව්‍යාපාර සහ රාජ්‍ය කළමනාකරණය, සේවා කළමනාකරණය, සමාජීය විද්‍යාව, තිරසාරබව, ආපදා කළමනාකරණය සහ නීතිය, භාෂාව සහ සාහිත්‍යය යන තේමාවන් යටතේ මෙම සමුළුව පැවැත්වීය.

- උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමා පාඨමාලාව සහ උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමා පාඨමාලාව යන පාඨමාලාවන්හි 2019 අධ්‍යයන වර්ෂයේ ශිෂ්‍ය කණ්ඩායම් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩමුළුවක් මාර්තු මස දී මානව සම්පත් අභිවර්ධන ආයතන ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

- මානව සම්පත් කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව සහ ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධි පාඨමාලාවන්හි 2019 වසර විද්‍යාර්ථීන් සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ මාර්ගගත වැඩමුළුව සහ කළමනාකරණ මූලධර්ම සහ භාවිතය පිළිබඳ වැඩමුළුව සාර්ථකව පවත්වන ලදී.

3. වාර්ෂික සමාලෝචනය 2021

3.1 අධ්‍යයන වැඩසටහන්

2021 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය කාණ්ඩ පහක් යටතේ අධ්‍යයන වැඩසටහන් 20ක් පවත්වන ලදී

- පශ්චාද් උපාධි වැඩසටහන්
- ප්‍රථම උපාධි වැඩසටහන
- විධායක ඩිප්ලෝමා වැඩසටහන්
- ඩිප්ලෝමා වැඩසටහන්
- සහතිකපත්‍ර වැඩසටහන්

3.1.1 පශ්චාද් උපාධි වැඩසටහන්

මානව සම්පත් අභිවර්ධන ආයතනය පශ්චාද් උපාධි හතරක් (04) ඉදිරිපත් කරයි. මානව සම්පත් අභිවර්ධන ආයතයේ පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා විද්‍යාර්ථීන් මූලිකවම ස්වකීය වෘත්තිය සංවර්ධනය වේගවත් කර ගැනීම, තෝරාගත් අංශයන්හි දැනුම ප්‍රගුණ කර ගැනීම, තම වෘත්තිය මාවත්වල ප්‍රගතියක් ලබා ගැනීම, රැකියා අවශ්‍යතා පූරණය කර ගැනීම මෙන්ම ඉපැයීමේ ශක්‍යතාව ඉහළ නංවා ගැනීම වැනි ඉලක්කයන් මුදුන් පමුණුවා ගැනීම අරමුණු කොට ගෙන අප ආයතනය හා එක්වේ.

මානව සම්පත් අභිවර්ධන ආයතනය අඛණ්ඩ ඇගයීම්, වැඩමුළු සහ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සහ ජාලගත සම්මන්ත්‍රණ ඇතුළත් වූ ආවේණික වූ ඉගැන්වීම් ශෛලිය විද්‍යාර්ථීන්ගේ අඛණ්ඩ වර්ධනය වේගවත් කරයි. මානව සම්පත් අභිවර්ධන ආයතනය සෑම විටම පාඨමාලා විෂය මාලා වැඩිදුර සංවර්ධනය සහ ශිෂ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා විද්‍යාර්ථීන්ගෙන් ලබා ගන්නා ප්‍රතිපෝෂණ කෙරෙහි අවධානය යොමු කරයි. තරගකාරී වෙළඳපොළ අවශ්‍යතා වෙනුවෙන් සැලසුම් කොට ඇති මෙම පශ්චාද් උපාධි පාඨමාලාවන්ගෙන් බිහිවන පශ්චාද් උපාධිලාභින් රටේ ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දේ.

වර්තමානයේ, මානව සම්පත් අභිවර්ධන ආයතනය විද්‍යාර්ථීන් සඳහා කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාද් උපාධි අධ්‍යයන පාඨමාලා හතරක් (04) පවත්වාගෙන යනු ලබන අතර ඒවා නම්,

- ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව
- මානව සම්පත් කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව
- සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව
- ආපදා විශ්ලේෂණ, කළමනාකරණ සහ පාලනය විද්‍යාපති පාඨමාලාව වශයෙනි.

ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයෙහි අවශ්‍යතා මානනය කෙරෙහි ව්‍යාපාර කළමනාකරණාධිපති පාඨමාලාව අවධානය යොමු කොට ඇති අතර මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ වර්තමාන අවශ්‍යතා කෙරෙහි මානව සම්පත් කළමනාකරණාධිපති පාඨමාලාව අවධානය යොමු කොට ඇත. සේවා කළමනාකරණ විද්‍යාපති උපාධිය අපගේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඇති විශේෂිත පශ්චාද් උපාධි පාඨමාලාවක් වන්නේ එය සේවා කළමනාකරණ වෙනුවෙන් පවත්වනු ලබන එකම පශ්චාද් උපාධි පාඨමාලාව වීමයි. එය සේවා අංශයේ සේවා සම්බන්ධ ඕනෑම ගැටලුවකට මනා විශ්වාසයකින් මුහුණ දීම සඳහා අවශ්‍ය කරන්නා වූ සංකල්පීය සහ විශ්ලේෂණාත්මක මෙවලම් සම්පාදනය කෙරෙහි අවධානය යොමු කොට ඇත.

භූ තොරතුරු විද්‍යාපති පාඨමාලාව සඳහා 2017 වර්ෂයේ සිට විද්‍යාර්ථීන් ලියාපදිංචි කරගැනීමක් සිදු කර නොමැති අතර ලියාපදිංචි වූ විද්‍යාර්ථීන්ට පාඨමාලාව සම්පූර්ණ කිරීමට අනුමැතිය දී තිබුණි.

2021 වර්ෂයේ පශ්චාද් උපාධි අධ්‍යයන වැඩසටහන්වල උපාධි පූර්ණ අනුපාතය 83% ක් විය.



	වාර්ෂික ඇතුළත් කරගැනීම					උපාධිලාභීන් සංඛ්‍යාව				
	2016	2017	2018	2019	2020	2016	2017	2018	2019	2020
ව්‍යාපාර කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව	61	95	115	96	70	0	127	125	64	86
මානව සම්පත් කළමනාකරණාධිපති උපාධි පාඨමාලාව	67	54	67	65	53	93	135	96	44	59
සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව	66	0	77	0	40	88	54	62	73	0
භූ තොරතුරු විද්‍යාපති උපාධි පාඨමාලාව	83	0	0	0	0	62	54	5	55	5
ආපදා විශ්ලේෂණ, කළමනාකරණ සහ පාලනය විද්‍යාපති උපාධි පාඨමාලාව	0	0	48	0	0	26	38	11	3	0

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.

[1]උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සිසුන් සංඛ්‍යාව දක්වයි එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.

3.1.2 ප්‍රථම උපාධි වැඩසටහන

3.1.2.1 ශ්‍රම කළමනාකරණවේදී උපාධිය/ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ප්‍රධාන අභිමතාර්ථ අතරින් එකක් වනුයේ අවශ්‍ය වන්නා වූ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක භාවයෙන් මානව කුසලතා වර්ධනය කර ගැනීම සහ ශ්‍රමික මෙන්ම කළමනාකරණරුවන් සාමූහික වරණයන් සහ සාමූහික ප්‍රයත්නයන් සඳහා අධ්‍යාපනය ලබා දීමත් ය. එයට අනුව ශ්‍රම අධ්‍යාපනවේදී වැඩසටහන ආරම්භ කරන ලදී. කෙසේවෙතත්, වෙළඳපොළ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සහ විද්‍යාර්ථීන්ට පුළුල් අවස්ථා උදා කරමින් 2020 වර්ෂයේදී, ශ්‍රම කළමනාකරණවේදී උපාධි වැඩසටහන හඳුන්වා දෙන ලදී.

2021 වර්ෂයේදී, අපේෂකයින් 193ක් ශ්‍රම කළමනාකරණවේදී උපාධි වැඩසටහනට ලියාපදිංචි වූ අතර ඉන් 152ක් සිංහල මාධ්‍ය සඳහා ද 41ක් ඉංග්‍රීසි මාධ්‍ය සඳහා ද විය.

මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන ශ්‍රම කළමනාකරණවේදී උපාධිය (සාමාන්‍ය) සහ ශ්‍රම කළමනාකරණවේදී (ගෞරව) උපාධිය යන මෙම වැඩසටහන් දෙකම කළමනාකරණ ක්ෂේත්‍රයේ පුළුල් විෂය ක්ෂේත්‍රයක් ආවරණය කරන අතර ඒවා ප්‍රථම වරට සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන් ම පැවැත්වේ. ශ්‍රම කළමනාකරණවේදී උපාධිය තුන් අවුරුදු වැඩසටහනක් වන අතර එය ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 5 වෙනි ස්ථරයට අයත් වේ. ශ්‍රම කළමනාකරණවේදී (ගෞරව) උපාධිය සිව් අවුරුදු වැඩසටහනක් වන අතර එය ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 6 වෙනි ස්ථරයට අයත් වේ. අධ්‍යයන දිශානතියේ මෙම සැලකිය යුතු වෙනස්කම් සමග, ලංකාවේ අංක එක ලෙසින් ශ්‍රේණිගත කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වන කොළඹ විශ්වවිද්‍යාලයෙන් තම උසස් අධ්‍යාපන කටයුතුවල නියැලීමෙන් පළපුරුද්ද මෙන්ම දැනුම ලබා ගැනීමට ද වෘත්තිය ජීවිතයේ ඉදිරියට ගමන් කිරීමට ද රැකියා නියුක්තිකයන්ට

අභ්‍යන්තර උපාධියක් ලෙසින් මෙම නව අධ්‍යයන වැඩසටහන ඉතා යෝග්‍ය වනු ඇත.

ශ්‍රම කළමනාකරණවේදී උපාධි වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවුවද රට තුළ පැවති කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් 2020 වසරේදී විද්‍යාර්ථීන් බඳවා ගැනීම සිදු නොකරන ලදී. 2021 වර්ෂයේ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ සමස්ථ උපාධි පූර්ණ අනුපාතය 77%ක් විය.



මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.

[1] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.

3.1.3. විධායක/උසස් ඩිප්ලෝමා වැඩසටහන්

මෙම වැඩසටහන්හි ප්‍රධාන පරමාර්ථය වන්නේ කළමනාකරුවන්ට වැඩ කිරීමේදී පවරා ඇති ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට සහ යාවත්කාලීන කිරීමට අවස්ථා සැලසීමයි. සියලුම විධායක ඩිප්ලෝමා වැඩසටහන් පුද්ගලික සංවර්ධනය කේන්ද්‍ර කොට ඇත්තේ පාඨමාලා හදාරන්නන්ට ඔවුන්ගේම හැසිරීම් චර්යා රටාවන්ට අභියෝග කරමින් පෞද්ගලික අත්දැකීමක් ලෙස ගෙන තම සේවාදායකයින් සමඟ ඵලදායී ලෙස කටයුතු කිරීමේ පදනමට එය ඉතා වැදගත් වේ යැයි ස්ථීර විශ්වාසයේ මුල් බැසගෙනය.

මෙම පාඨමාලාවන්හි අධ්‍යයන කාලය එක් වසරකි. මානව සම්පත් අභිවර්ධන ආයතනය ඊටම ආවේණික වූ ඉගැන්වීම් ශෛලිය, අඛණ්ඩ ඇගයීම්, වැඩමුළු සහ ක්ෂේත්‍ර අධ්‍යයන හේතුවෙන් ශිෂ්‍යයින්ට ඔවුන් වෘත්තියභාවය සංවර්ධනය කර ගැනීමට වේදිකාව සම්පාදනය කරයි.

වසංගත තත්වය සහ නව පාඨමාලා විෂයමාලා සංවර්ධන කටයුතු හේතුවෙන් තාවකාලිකව නවත්වන ලද පාඨමාලාවන් ආරම්භ නොකිරීම හේතුවෙන් 2021 වර්ෂයේදී, ශිෂ්‍ය බඳවා ගැනීම් සිදු කෙරුණේ සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව සහ උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමාව යන පාඨමාලා සඳහා පමණි.



	වාර්ෂික ඇතුළත් කර ගැනීම					සුදුසුකම්ලත් සංඛ්‍යාව				
	2016	2017	2018	2019	2020	2016	2017	2018	2019	2020
මානව සම්පත් කළමනාකරණය විධායක ඩිප්ලෝමාව	35	0	17	0	0	81	0	35	0	21
සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව	107	0	0	0	0	51	0	115	0	0
සංචාරක, සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව	0	0	0	30	22	34	0	0	0	19
උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමාව	0	0	49	0	80	0	0	0	0	25

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.

3.1.4 ඩිප්ලෝමා පාඨමාලා

මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් ඩිප්ලෝමා වැඩසටහන් 04ක් පිරිනමනු ලබන ලබයි.ඒවා කළමනාකරණ, මානව ශාස්ත්‍ර සහ භාෂා පාඨමාලාවලින් සමන්විත වේ. මෙම පාඨමාලා මූලික මට්ටමේ රැකියා නියුක්තිකයන්ට තමන්ගේ අදාළ ක්ෂේත්‍රය තුළ දැනුම, විශ්ලේෂණාත්මක චින්තනය, හැකියාවන් ගොඩනැගීම, සදාචාරාත්මක ප්‍රමිතීන්, නායකත්වය සහ වගකීම් දැරීම දියුණු කිරීම සඳහා සහාය වීමට සැලසුම් කර ඇත. සිසුන්ට ඔවුන්ගේ විවිධ අවශ්‍යතාවන් සපුරා ගැනීමට මෙම ඩිප්ලෝමා පාඨමාලා මහෝපකාරී වේ. ඇතැම් අවස්ථාවල දී ඒවා අධ්‍යාපන කටයුතුවල විවිධ අවධීන් අතර ඇති පරතරය පුරවාලීම සඳහා හෝ අමතර වෘත්තීය පුහුණුවක් සහ සුදුසුකම් සැපයීම සඳහා උපකාරී වේ. තවද ඩිප්ලෝමා පාඨමාලාවක් මගින් වැදගත් විශේෂිත කුසලතා, දැනුම සහ අත්දැකීම් සම්පාදනය කරයි.

වෘත්තිය උපදේශකවරයෙකු වීම සඳහා තම කුසලතා වැඩි දියුණු කර ගැනීමට කවුරුන් හෝ අධ්‍යයන වැඩසටහනක් සොයන්නේ නම්, ඔහුගේ/ ඇයගේ අධ්‍යයන අරමුණ සාක්ශාත් කර ගැනීමට උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව විශිෂ්ඨ අවස්ථාවක් ලබා දේ. මෙම පාඨමාලාව වෘත්තිය උපදේශකවරයෙකුගේ කාර්යභාරය කෙරෙහි ඉලක්ක කොට ශක්තිමත් පදනමක් ලබා දීමට නිර්මාණය කර ඇත. මෙම වැඩසටහනේ ප්‍රායෝගික අංග සේවා පරිශීලකයා සමග ශක්තිමත් සම්බන්ධතාවක් ගොඩ නඟා ගැනීමට මෙන්ම ඔවුන්ගේ ජීවිතයේ යහපත් දියුණුවක් ඇති කර ගැනීමට මඟ පෙන්වීම සඳහා පුද්ගලයෙකුගේ මූලික උපදේශන කුසලතා ශක්තිමත් කරනු ඇත. උපදේශන මනෝවිද්‍යා විප්ලෝමාව හැදෑරීමෙන් ශිෂ්‍යයින් මූලික උපදේශන ක්‍රම සහ ප්‍රවේශයන් ඉගෙන ගනු ඇත.

නව විෂයමාලා සංවර්ධනයෙන් පසු සේවා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2021 වසරේදි ශිෂ්‍ය බඳවා ගැනීම නැවත ආරම්භ කරන ලදී. තවද මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව සඳහාද ශිෂ්‍යයින් ලියාපදිංචි කර ගැනීමට මෙම වසරේදී හැකියාව ලැබුණි.



	2016	2017	2018	2019	2020	2016	2017	2018	2019	2020
	වාර්ෂික ඇතුළත් කර ගැනීම					සුසුසුකම්ලත් සංඛ්‍යාව				
සේවා කළමනාකරණ ඩිප්ලෝමාව	20	0	0	0	0	37	0	27	11	0
මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව	0	0	0	46	40	0	0	27	0	28
උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව	0	0	49	0	78	23	55	29	29	15
අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව	124	96	90	92	0	123	100	74	73	0

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.

3.1.5 සහතිකපත් පාඨමාලා

මානව සම්පත් අභිවර්ධන ආයතනය ශිෂ්‍යයින්ගේ වෘත්තිමය සංවර්ධනය ඉලක්ක කොට විවිධ විෂය ක්ෂේත්‍රයන්හි සහතිකපත් පාඨමාලා දහයක් (10) පිරිනමනු ලබයි. මෙම වැඩසටහන්වල විස්තර පහත ප්‍රස්ථාර හා වගු මගින් පෙන්වා ඇත. මෙම වැඩසටහන්වල පාඨමාලා කාල සීමාව මාස 03 සිට මාස 08 දක්වා වේ.

කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යයන ක්‍රමවේදයෙන් බැහැරව මාර්ගගත අධ්‍යයනය ඔස්සේ පාඨමාලාවන් පවත්වාගෙන යාමට ආයතනය කටයුතු කරන ලදී. ආරම්භයේදී මාර්ගගත ඉගෙනුම් වෙත යොමු වීමේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විවිධ තාක්ෂණික ගැටලු රාශියකට මුහුණ දුන්න ද සියලු අධ්‍යයන වැඩසටහන් මාර්ගගත ඉගෙනුම් ක්‍රමය භාවිතයෙන් සුමටව ක්‍රියාත්මක කිරීමට ආයතනයට හැකි විය.

2021 අධ්‍යයන වර්ෂයේ දී, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සිසුන් බඳවා ගැනීම සිදු කෙරුණේ සහතික පත්‍ර පාඨමාලා හයක (06) පමණි. එයට ජපන් හා කොරියානු භාෂා සහතිකපත් පාඨමාලා දෙක (02) ද අලුතින් ඇතුළත් විය.

අතිරේක භාෂා පාඨමාලාවක් ලෙස දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම සඳහා සිසුන් 124 දෙනෙකු ලියාපදිංචි වූ අතර කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පන්ති පැවැත්වීමට බාධා ඇති විය. නමුත් දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව 16 - මූලික සහ දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව 15 - අන්තර්මධ්‍යම මාර්ගගත ඉගෙනුම් ක්‍රමය යටතේ පැවැත්විය. සහතිකපත් වැඩසටහන්වල පාඨමාලා පූරණ අනුපාතය 93% ක් විය.



	වාර්ෂික ඇතුළත් කර ගැනීම					සුදුසුකම් ලත් සංඛ්‍යාව				
	2016	2017	2018	2019	2020	2016	2017	2018	2019	2020
ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව	1321	1321	2283	1938	512	0	986	1523	0	1422
ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව	217	0	413	429	64	0	143	269	0	300
ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව	67	0	48	52	0	0	55	25	0	44
කථන ඉංග්‍රීසි සහතිකපත් පාඨමාලාව	3637	1933	580	383	0	2706	1471	0	391	239
පාසල් හැරයන්නන් ඉංග්‍රීසි භාෂා කෙටිකාලීන පාඨමාලාව	130	54	342	507	213	0	45	101	390	444
පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව	452	0	412	423	0	320	336	275	347	148
දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික	341	405	327	427	284	242	203	0	196	261
දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම	160	145	157	110	0	159	109	104	115	96

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.

[1] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.

3.2 2021 වර්ෂයේ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු

මානව සම්පත් අභිවර්ධන ආයතනය තුළ, පශ්චාත් උපාධි, උපාධි සහ ඩිප්ලෝමා හදාරන ශිෂ්‍යයින් ඔවුන් අදාළ අධ්‍යයන පාඨමාලාවේ අනිවාර්ය අංගයක් ලෙස වැඩමළුවලට සහභාගී විය යුතුය. මෙම වැඩසටහන් ශිෂ්‍යයින්ගේ වෘත්තීය සංවර්ධනය ඉලක්ක කොටගෙන පවත්වනු ලබයි. දේශන මෙන් නොව, වැඩමුළු මගින් වෘත්තිය ලෝකයට අවශ්‍ය මාතෘකා පිළිබඳ විවෘතව සාකච්ඡා කිරීමට සහ නව අදහස් ඉදිරිපත් කිරීමට සංවාදාත්මක සාකච්ඡා සඳහා දිරි ගන්වනු ලබයි. සහභාගීවන්නන්ට ගැටලු හමුවේ මුහුණ දීමේ දී ගැටලු නිරාකරණයට ඔවුන්ගේ දෘෂ්ටිය අනුව ගැටලු විසඳා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ අදහස් හුවමාරු කර ගත හැක. නව කුසලතා දියුණු කර ගැනීමට වැඩමුළු උපකාරී වන අතර එය ශිෂ්‍යයින්ගේ ප්‍රගතිය කෙරෙහි උපකාරී වේ. ශිෂ්‍යයින්ට ඔවුන්ගේ ඉදිරිපත් කිරීමේ, නායකත්වයේ, සන්නිවේදනයේ, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ කුසලතා වැඩි දියුණු කර ගත හැකිය. තවද මෙම වැඩමුළු මගින් විවිධ පරිසරවල මෘදු කුසලතා සංවර්ධනය චිත්ත සංවේදීතාව සංවර්ධනය කිරීම, නිර්මාණශීලී සහ අවදානම් තීරණ ගැනීම් ඉගෙනුම, එක්ව වැඩ කරන්නේ කෙසේද යන්න පිළිබඳ ඇති දැනුවත්බව සහ මිනිසුන් සමඟ සාකච්ඡා කිරීම දියුණු කිරීම, අන්‍යයන්ගෙන් සහ ඔවුන් තුළම ඇතිවන ආතතිය සහ ගැටුම් දුරලීම වැනි පුළුල් පරාසයක පැතිර ඇති මෘදු කුසලතා වර්ධනය කිරීමට පහසුකම් සපයයි.

2021 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය, ශිෂ්‍යයින්ගේ, රාජ්‍ය/පෞද්ගලික අංශවල සේවා නියුක්තිකයන්ගේ දැනුම, කුසලතා, ආකල්ප, වැඩි දියුණු කිරීමේ අරමුණින් පශ්චාද් උපාධි, ප්‍රථම උපාධි, සහ ඩිප්ලෝමා පාඨමාලාවල ලියාපදිංචිව සිටින සිසුන්ට මෙන්ම ආයතන සම්පත් සායකයින්ගේ මෙහෙයවීමෙන් පුහුණු වැඩමුළු, ජනතා දැනුවත් කිරීම් වැඩසටහන් මෙන්ම ජාත්‍යන්තර වැඩමුළු ද ඇතුළත්ව වැඩසටහන් 16ක් පවත්වන ලදි.

වර්ගය	වැඩමුළුව	සහභාගි වූ සංඛ්‍යාව	ඉලක්ක කණ්ඩායම
වැඩමුළු	ව්‍යාපෘති වාර්තා යෝජනා ඉදිරිපත් කිරීම	58	මානව සම්පත් කළමනාකරණාධිපති පාඨමාලාව - අංක 10 (2019)
	ව්‍යාපෘති වාර්තා යෝජනා ඉදිරිපත් කිරීම	93	ව්‍යාපාර කළමනාකරණාධිපති පාඨමාලාව - අංක 08 (2019)
	කළමනාකරණ මූලධර්ම සහ භාවිතයන් ඉදිරිපත් කිරීම	66	ව්‍යාපාර කළමනාකරණාධිපති පාඨමාලාව - අංක 09 (2020)
	කළමනාකරණ මූලධර්ම සහ භාවිතයන් ඉදිරිපත් කිරීම	56	මානව සම්පත් කළමනාකරණාධිපති පාඨමාලාව - අංක 11 (2020)
	ව්‍යාපෘති වාර්තා ප්‍රගතිය ඉදිරිපත් කිරීම	58	මානව සම්පත් කළමනාකරණාධිපති පාඨමාලාව - අංක 10 (2019)
	ව්‍යාපෘති වාර්තා ප්‍රගතිය ඉදිරිපත් කිරීම	93	ව්‍යාපාර කළමනාකරණාධිපති පාඨමාලාව - අංක 09 (2020)
කෙෂ්ත්‍ර අධ්‍යයන	මත්ද්‍රව්‍ය යැපෙන්නන්ට ප්‍රතිකාර කිරීම	29	මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2021
ප්‍රදර්ශන / මහජන කාර්යසාධන සංවිධානය කිරීම්	සමබර ජීවිතයක් සඳහා මනෝවිද්‍යාව	175	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්
	Merseyside ව්‍යාපාරික නවක වැඩසටහන	සැසියකට 15-20	එක්සත් රාජධානියේ ලිවර්පුල් පාසල් දරුවන්
ගුවන්විදුලි / රූපවාහිනි වැඩසටහන්	ඩොලර් රුපියල් කට සහ බඩ - අලුත් පාර්ලිමේන්තුව (Derana TV)	-	පොදු ජනතාව
	ආර්ථික අර්බුදය හා කළමනාකරණ සැලසුම් BIG FOCUS (Derana TV)	-	පොදු ජනතාව
	සුභාරති ගුවන් විදුලි වැඩසටහන	-	පොදු ජනතාව
	CBSL වැඩසටහන	-	පොදු ජනතාව
	ස්වදේශිය සේවය වැඩසටහන මානව සම්පත් කළමනාකරණය හරියට ක්‍රියාත්මක කරන්නේ කොහොමද (Good Morning Sri Lanka, Siyatha TV)	-	පොදු ජනතාව
	අසමාන ලෝකයේ මානසික සෞඛ්‍ය -සෙනෙහස (Derana TV)	-	පොදු ජනතාව
වෙනත් මාධ්‍ය වැඩසටහන්	මාධ්‍ය වැඩසටහන - PAVS Convocation 2020	20-30	ලතින් ඇමරිකානු කලාපයේ විද්වතුන්

මූලාශ්‍රය රැස් කළ දත්ත, 2021, මා.ස.අ.ආ.

3.3 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

පර්යේෂකයාගේ නම	මාතෘකාව	ප්‍රකාශිත දිනය	ස්ථානය/ ප්‍රකාශනය
ජ්‍යෙෂ්ඨ මහාචාරඣය එච්.ඩී. කරුණාරත්න මහතා	Migration as an Economic structure	2021	ශ්‍රී ලංකා ආර්ථික ජර්නලය
කේ.පී. මාතොටආරච්චි මිය (සමකතෘ - කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා)	Philosophy of Approaches in Social Science: A Review of Positivism, Phenomenology and Critical Social Sciences Qualitative Research	2021	Technium සමාජීය විද්‍යා ජර්නලය
කේ.පී. මාතොටආරච්චි මිය (සමකතෘ - කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා)	The Social Structure of the City: A Critical Reviewof Contributing Sociologists	2021	වත්මන් නාගරික අධ්‍යයනය
කේ.පී. මාතොටආරච්චි මිය (සමකතෘ - කේ.ඒ.ඒ. එන්. තිලකරත්න මහතා, ඩබ්.එම්.සී.පී. ගොඩගේ මිය)	From Conflict to Coexistence: A Critical Look at issues Related to Human-Wildlife Interactions in Sri Lanka	2021	නීතීය සහ පාලනය පිළිබඳ ආසියානු ජර්නලය
කේ.පී. මාතොටආරච්චි මිය (සමකතෘ - කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා)	Perspective from natural law and sociological school of Law	2021	නීතී ප්‍රතිපත්තිය සහ සමාජ සමාලෝචනය
කේ.පී. මාතොටආරච්චි මිය (සමකතෘ - එච්. සුගතදාස, බී. චන්ද්‍රසිරි, කේ. දිල්රුක්ෂ, ටී.ටී. ජයමහා, ඩබ්.ඒ. ලෝවේ, ටී. පීරිස්, පී. පුෂ්පකුමාර)	Impact of CRM Strategies towards customer loyalty; with special reference to the customers of privet hospitals in Colombo	2021	IJRDO - ව්‍යාපාර කළමනාකරණ ජර්නලය
කේ.පී. මාතොටආරච්චි මිය (සමකතෘ - කේ.ඒ.ඒ. එන්. තිලකරත්න මහතා, ඩබ්.එම්.සී.පී. ගොඩගේ මිය)	The need for data protection in a Sri Lankan context: A Critical Review with special Reference to the Pandemic Period	2021	දෙවන ජාත්‍යන්තර සමුලුව 2021 IC2 - මානව සම්පත් අභිවර්ධන ආයතනය
ඒ.සි. ඇපා (සමකතෘ - කේ.පී. මාතොටආරච්චි මිය)	Impact of service Flower on Customer satisfaction in Western Province Hotel Service – Sri Lanka	2021	ආර්ථික විද්‍යාව ව්‍යාපාරික සංචාරක සහ සමාජ විද්‍යාව ජාත්‍යන්තර සමුළුව :ICEBTS-2021) මැලේසියාව (Online)
කේ.පී. මාතොටආරච්චි මිය	The Study on the Impact of Cooperate Social Responsibility (CSR) on Customer Loyalty and Customer Satisfaction; with Related to the supermarket industry in Sri Lanka	2021	ආර්ථික විද්‍යාව ව්‍යාපාරික සංචාරක සහ සමාජ විද්‍යාව ජාත්‍යන්තර සමුළුව :ICEBTS-2021) ඉන්දුනිසියාව (Online)
ආචාර්ය ඩබ්.එස්. චන්ද්‍රසේකර (සමකතෘ - ඩබ්.ඩී. චන්ද්‍රසේන, ටී.ඩී. සින්හාරච්චි, එස්. රූබසිංහ)	Relations of G.C.E (O/L) Student's Biology Self-Concept and Motivation with their Achievement and Misconceptions	2021	ආර්ථික විද්‍යා, වාණිජ හා කළමනාකරණ ජාත්‍යන්තර ජර්නලය

ආචාර්ය ඩබ්.එස්. චන්ද්‍රසේකර	The Impact of perceived of COVID-19 on Future Anxiety and Psychological Well-being in Sri Lanka: A cross-sectional study.	2021	රජරට සමාජ විද්‍යා ජර්නලය
සී.එල්. එදිරිසිංහ මෙය (සමකතෘ - මහාචාර්ය පි. කයිලාසපති මහත්මිය)	Why Do Only Some People Blow the Whistle? A Multi-Theoretical perspective	2021	කළමනාකරණය ශ්‍රී ලංකා ජර්නලය
සි.එල්. එදිරිසිංහ මෙය (සමකතෘ - කේ.ඒ.ඒ. එන්.තිලකරත්න මහතා)	Bullied after Blowing the Whistle: An Integrative Literature Review	2021	හිපිං නිති සමාලෝචනය
සි.එල්. එදිරිසිංහ මෙය (සමකතෘ - මහාචාර්ය පි. කයිලාසපති මහත්මිය)	To Tell or Not to tell: Individual factors Related to Whistle-blowing intention (under review)	2021	මානව සම්පත් ආසියා පැසිෆික් ජර්නලය
එම්.ඩබ්.එන්.ටී. වීරක්කොඩි (සමකතෘ - සි.එල්. එදිරිසිංහ මෙය)	Developing an informated workplace: Information communication technology adoption and human resource management (Under review)	2021	මානව සම්පත් අභිවර්ධන ආයතන ජර්නලය
මහාචාර්ය එස්.ලී (සමකතෘ - කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා)	Encyclopedia of Public International Law in Asia (3 Vols)	2021	Brill ප්‍රකාශන
කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා	The Role of the Judiciary in Recognizing and Implementing International law: A Comparative Analysis with Special Reference to Sri Lanka	2021	ලිබට් සහ ජාත්‍යන්තර කටයුතු ජර්නලය
කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා (සමකතෘ - එන්. ජයරත්න)	Theories Involed in Recognizing and Implementing International Law in Domestic Contexts	2021	නිති ප්‍රතිපත්ති සහ ගෝලියකරණ ජර්නලය
කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා	A Utopia or Reality: Possibility of Using the Properlaw of Contract throughout an International Commercial Arbitration Claim.	2021	බීජීං නිති සමාලෝචනය
කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා (සමකතෘ - පී.පි.ඩී.මදුෂාන්)	Revolutionary Forces and the Grundnorm: A Critical Review of the Leagality and the recognition of New Constitutional orders	2021	සමාජ ප්‍රතිපත්ති සහ නීතිය ජාත්‍යන්තර ජර්නලය
කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා (සමකතෘ - එච්.එස්.ඩී. මෙන්ඩිස්, එන්. ජයරත්න)	The success and failure in the implementation of Convention on Biological Diversity in Sri Lanka	2021	සමාජීය විද්‍යා පර්යේෂණ සහ නවෝත්පාදන ජර්නලය
එස්. ප්‍රනාන්දු (සමකතෘ - කේ. ඒ.ඒ.එන්. තිලකරත්න මහතා)	On the Myth and magic of Apparitions: A study based on Mother Mary's Church in SriLanka	2021	

කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා (සමකතෘ - එච්.එස්.ඩී.මෙන්ඩිස්)	Scales of Natural Justice in a Military summary Trial: A Critical Analysis with special Reference to SriLanka	2021	14 වැනි KDU ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව
එච්.එස්.ඩී. මෙන්ඩිස් (සමකතෘ - කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා, එම්.ඩී.ඒ.අයි. ගුණතිලක, ඒ.ජී.ආර්.එම්. විජයවර්ධන)	Unfairness, Legitimate Expectation and proportionality as Foundations of Judical Review: A Comparative Analysis of Sri Lanka and United Kingdom	2021	KDU නීතී ජර්නලය
මහාචාර්ය ඩබ්ශ්‍රී සෙනෙවිරත්න (සමකතෘ - කේ. ඒ.ඒ.එන්. තිලකරත්න මහතා)	Implementing Customary International law in Domestic Contexts: A Comparative Study with Special Reference to Sri Lanka	2021	ජාත්‍යන්තර සබඳතා දෙපාර්තමේන්තු වාර්ෂික පර්යේෂණ ජර්නලය
කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා (සමකතෘ - ඩී.ජේ.පී.කේ. හෙයියන්තුඩුවගේ)	Right to Health Care during Covid-19 Pandemic: A Critical Review of SriLankan Law against international standards	2021	පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර පර්යේෂණ සැසිය
කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා (සමකතෘ - ඩී.ජී.සී.එන්. බණ්ඩාර)	Is There a Duty on States to prevent the Spread of Covid-19 Virus? Reflections on the Applicability of International Law Principle on State Responsibility	2021	විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසිය
කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා (සමකතෘ - එම්.ඒ.ඩී.මදුෂංක)	Livelihood Environmentalism and judicial Activism: A Critical Review of Sri Lankan	2021	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 5 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව
එච්.එස්.ඩී. මෙන්ඩිස් (සමකතෘ - කේ.ඒ.ඒ.එන්. තිලකරත්න මහතා, එන්.ජයරත්න)	Liability under action legis aquiliae for breach of quarantine: A critical review with special reference to SriLanka	2021	ශ්‍රී ලංකා වෛද්‍ය නීතී සංගමයේ වාර්ෂික සමුළුව
එම්.ඒ.ඩී. මදුෂංක මහතා (සමකතෘ - කේ.ඒ.ඒ.එන්. තිලකරත්න)	Achieving sustainable development goals related to healthcare: Challenges faced by women with disabilities during the COVID-19 pandemic	2021	ජනවිකාස දේපාර්තමේන්තුවේ වාර්ෂික පර්යේෂණ සමුලුව
එම්.ඒ.ඩී. මදුෂංක මහතා (සමකතෘ - කේ.ඒ.ඒ.එන්. තිලකරත්න, කේ. මුණසිංහ)	A sociology Analysis of News reporing During Covid-19 pandemic: A review of the Srilankan practices	2021	සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ වාර්ෂික පර්යේෂණ සමුළුව
එම්.ඒ.ඩී. මදුෂංක මහතා (සමකතෘ - කේ.ඒ.ඒ. එන්.තිලකරත්න)	The Socilogical significance of usage of Libraries During the COVID-19 pandemic:Experiences of Faculty of Arts University of Colombo	2021	NILIS පර්යේෂණ සම්මන්ත්‍රණය

එම්.ඒ.ඩී. මදුෂංක මහතා (සමකතෘ - කේ.ඒ.ඒ.එන්. තිලකරත්න)	Competing Interest of Environmental protection and resettlement: An Analysis of the Wilpattu Judgement	2021	ශාස්ත්‍ර පීඨ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව
එම්.ඒ.ඩී. මදුෂංක මහතා (සමකතෘ - කේ.ඒ.ඒ.එන්. තිලකරත්න)	Filling the gaps and addressing the deficiencies concerning the rights of purchasrs of provisional condominium property: Prospectus and challenges from a Srilanka context	2021	නීතී පීඨ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය
